# වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාරයේඓතිහාසික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

එන්.ජී.අයි.එම්. වික්‍රමසිංහ[1], එස්.ඩබ්.පී.පී.සාවිත්‍රි රුවනී දසනායක[2],එල්.නුවනි අනුපමා[3]

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[1]ireshawickramasinghe123@gmai.com,[2]savi3dasanayaka@gmail.com,
,[3]wajiranalinda1988@gmail.com

ප්‍රමුඛ පදඃ වේගිරිය, වවුල්ගල ලෙන්, අවලෝකිතේශ්වර නාථ, ශෛලමය

## හැඳින්වීම

මහනුවර දිස්ත්‍රික්කයේ මැදපළාත කෝරළයේ වේගිරිය ග්‍රාමනිධාරී වසමෙහි වේගිරිය නාථ දේවාලයත් ඊට අනුබද්ධ රජමහා විහාරයත් පිහිටුවා තිබේ. මෙම ක්ෂේත්‍රය තුළ වවුල්ගල ලෙන් පද්ධතිය ආශ්‍රිත පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිය, නාථ දේවාලය, රජමහා විහාරය, පත්තිනි දේවාලය, ගම්පොල රාජධානි යුගයට අයත් සෙල්ලිපිය හා සිංහාසනය නම් ගොඩනැගිල්ල දැකගත හැකි ය. අනුරාධපුර යුගය දක්වා දිවෙන ඉතිහාසයක් පිළිබිඹු කරන පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ශිලා ලේඛනයත් ගම්පොල හා මහනුවර යුගයන් නිරූපණය කරන විහාර හා දේවාල සංකීර්ණයත් අදාළ ක්ෂේත්‍රය තුළ ඇති ඓතිහාසික වටිනාකම තහවුරු කරන සාධකයන්ය. මේ ආශ්‍රිතව ඇති ගල් ලෙන්, කැටයම් සහිත දැව කණු, ගල් උළුවස්ස, බුද්ධ ප්‍රතිමා, බෝධිසත්ව ප්‍රතිමා, සඳකඩ පහණ් ආදී වූ පුරාවිද්‍යාත්මක නටබුන් ද මෙහිදී විශේෂ අවධානයකට ලක්කෙරෙයි.

## අරමුණ

වේගිරිය නාථ දේවාලය හා විහාර සංකීර්ණය ආශ්‍රිතව ඇති පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගනිමින් එහි ඓතිහාසික පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මූලාශ්‍ර ගවේෂණයේදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සෙල්ලිපිත් යොදාගන්නා ලද අතර සම්මුඛ සාකච්ඡා මඟින් ද දත්ත එකතු කර ඇත. වේගිරිය ක්ෂේත්‍රය තුළ සිදුකරන මතුපිට ගවේෂණය හරහා ඒ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කර ක්‍රමවේදය සකස් කර ගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡා

වේගිරිය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීමේදී එහි වඩාත් ඓතිහාසික සාධක පෙන්වන්නේ වවුල්ගල ලෙන් පද්ධතියයි. වවුල්ගල ලෙන් ආශ්‍රිතව පිහිටුවා ඇති සෙල්ලිපිය මෙහි ඉතිහාසය අනුරාධපුර යුගය දක්වාඈතට ගමන් කරයි. එහි සඳහන් කර ඇති අක්ෂර ක්‍රි.පූ. 3 වැනි ශතවර්ෂයත් ක්‍රි.ව. 2 වැනි ශවර්ෂයත් අතර කාල පරිච්ඡේදයට අයත් වන බව සෙනරත් පරණවිතාන පෙන්වා දී ඇත. භූ විපර්යාසයක් හේතුවෙන් ලිපිය සහිත ලෙන පහත් වීමෙන් එහි ළඟා වීමේ අපහසුතාවයක් ඇති අතර පරණවිතානයන්ගේ කියැවීමට අනුව ගොවි, කම්කරු හා මැණික්කරුවන් පිළිබඳ සාධක මෙ මඟින් හෙළි වේ.

### *1. ඔත ගුමනග තිශහ උපශික ගුමනය උපශික තිශලය උපශක...*

***කුමරශ ගපති දුටකශ කුඩකර සොණහ දටික සුමනශ***

***2. මණිකර දතෙ පතිකෙ මණිකර වචෙ ශපතිකෙ*** (Paranavithana,1983)

කටාර කොටන ලද ගල්ලෙන් බහුල වවුල්ගල ලෙන් පද්ධතිය අනුරාධපුර යුගයේ දී වන සෙනසුනක්ව පවතින්නට ඇතැයි හඳුනාගත හැකිය. වේගිරිය දේවාලය ඉදිරිපිට ඇති ගල් තලාවෙහි පිහිටුවා ඇති සෙල්ලිපියේ මුල් පේළි තුනෙහි එය බුද්ධ වර්ෂ 1957 වැනි වර්ෂයේ එනම් ක්‍රි.ව. 1415 නවම් මස දහවන දා පිහිටවූ බව සඳහන් වේ. ඉදිරි දස වර්ෂයක් සඳහා අවලෝකිතේශ්වර නාථ දේවාලයේ නඩත්තු කටයුතු වෙනුවෙන් කරන ලද ඉඩම් ප්‍රදානයන් පිළිබඳ මෙහි සටහන් කර ඇත. සෙනරත් පරණවිතාන හා නන්දසේන මුදියන්සේට අනුව මෙය V වැනි බුවනෙකබාහු විසින් පිහිටුවා තිබේ. සෙල්ලිපිය මඟින් තහවුරු වන අන්දමට ක්‍රි.ව. 14 වැනි ශතවර්ෂයට අයත්වන මෙම නාථ හෙවත් කන්දේ දේවාලය අවලෝකිතේශ්වර නාථ දෙවියන් සඳහා ඉදිවූවකි. අඩි 3 අඟල් 4ක් උස අවලෝකිතේශ්වර නාථ ප්‍රතිමාව මහාරාජ ලීලාවෙන් හා ලලිතාසනයෙන් දක්වා තිබේ. වෙනත් මහායාන ප්‍රතිමාවල මෙන් මෙහි ජටා මකුටයෙහි බුදුරුවක් දක්වා නැති අතර එය ස්ථූපාකාර හැඩයක් ගනී. දකුණතින් විතර්ක මුද්‍රාව දක්වන අතර වමත අසුන මත තබා සිරුර බර කර තිබේ. නාථ ප්‍රතිමාවට යාබදව අඩි 2 2/1 ක් පමණ උසට තාරා දෙවඟන හෙවත් බිසෝ බණ්ඩාර දේවියගේ ප්‍රතිමාව නිර්මාණය කර ඇත. දකුණතින් අභය මුද්‍රාවත් වමතින් වරද මුද්‍රාවත් දක්වන එය ආභරණවලින් සරසා කාන්තා ලාලිත්‍ය ඔප්නැංවෙන අයුරින් නිර්මාණය කර ඇත. නාථ දේවාලයට මුහුණ ලා ඇති පත්තිනි දේවාලයද වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් නාථ දේවාලයට සමාන වේ.

දේවාලය සහිත ලෙනෙහි නිර්මාණය කර ඇති වේගිරිය රජමහා විහාරය ගම්පොල යුගයේ වාස්තුවිද්‍යා ලක්ෂණවලින් යුක්ත වේ. එහි වහල ගල් ලෙනින්ම නිර්මාණය වී ඇත. විහාරයට පිවිසීමට ගල් උළුවස්සක් සහිත දැවැන්ත දොරකි. දොරටුවට දකුණුපස බිත්තිය ආසන්නයේ සමාධි බුද්ධ ප්‍රතිමාවක්, පරිවාර භික්ෂු පිළිම දෙකක් හා කුඩා චෛත්‍යයක් නිර්මාණය කර තිබේ. මෙම ප්‍රතිමා ත්‍රිත්වයම හින්දු ආභාෂය ලත් ගම්පොල යුගයේ ප්‍රතිමා ලක්ෂණ පෙන්වයි. බිත්ති තුනක සහ සිවිලිමෙහි දේව රූප, බුද්ධ රූප හා මල් මෝස්තර රටා දක්වන සිතුවම් මහනුවර යුගයේ සිතුවම් ශෛලිය මනාව පිළිඹිබු කරයි. මෙම ගර්භ ගෘහය ඇතුළත අඩි පහක් පමණ උස චෛත්‍යයක් පිහිටුවා ඇත. එය පේසා වළලු, ගර්භය, සතරැස් කොටුව, දේවතා කොටුව, කොත හා කොත් කැරැල්ල ද චූඩා මාණික්‍යයෙන්ද සමන්විත වේ.

වේගිරිය දේවාලයට පිවිසෙන දොරටුවේ ඉදිරිපස පිහිටුවා ඇති ශෛලමය සඳකඩ පහණ මහනුවර යුගයේ ලක්ෂණ පෙන්නුම් කරයි. දෙපස ඇති කුඩා කවාකාර කොටස් දෙකෙහි හස්ති රූප දෙකකුත් අනතුරුව හොටින් නෙළුම් මලක් ගත් හංස රූප ද සිංහ හා අශ්ව රූප ද නෙලා ඇත. භයංකාර ස්වරූපයක් පෙන්වන සිංහ රූප දෙක මධ්‍යයේ කිඹිසි මුහුණකි. සඳකඩපහණ මධ්‍යයෙහි පූර්ණ නෙළුම් මලක් මල් කෙමි හිත මංජරියද ඉස්මතු කරමින් නෙළා ඇත. විහාරය ඉදිරිපස ඇති සඳකඩ පහණ මධ්‍යයේ ද පූර්ණ නෙළුම් මලක් ද ඉදිරිපස කවයෙහි මල් පොකුරක් හෝ කිඹිසි මුහුණක්ද සරලව දක්වා තිබේ.

විහාරයට පිවිසෙන ගල් උළුවස්ස අඩි 6යි අඟල් 3කින් උසින් යුතු වෙයි. එහි පළල අඩි 4කි. මෙහි අඟල් 9ක සණකමකින් යුක්තය. උළුවහු කණු දෙකේ පහළ කෙළවරේ කොටුවක් තුළ සිංහ රූප දෙකක් නෙළා ඇති අතර කණු දෙකේ

ඉහලට අලංකාර ලියවැල් රටාවක් විහිදෙයි. උළුවස්ස වටාම ගමන් කරන පළාපෙති හැඩැති බොරදම් රටාවකි. නාථ දේවාලය හා විහාරය ඇසුරෙහි සම්පූර්ණ දූව කණු තුනක් දක්නට ලැබෙයි. සරල පද්මයන් සහිත පනේල වලින්ද පේකඩ කැටයමින්ද අලංකාරවන ඒවා ආසන්නයේ පිහිටා ඇති ඇම්බැක්කේ දූව කැටයම්වලට සමීප සම්බන්ධතාවක් පෙන්වයි. මෙම දූව කණු කෘමි හායනයට ලක්ව තිබීමත් ගල් උළුවස්ස සහ ඉපැරණි සිතුවම් වටා සුදු හුණු ආලේප කිරීමේ දී එම හුණු සිතුවම්වල තැවරී තිබීමත් වේගිරිය ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ප්‍රධානතම ගැටළුවකි.

## නිගමනය

වේගිරිය දේවාලය හා රජමහා විහාරය ආශ්‍රිතව සිදුකරන ලද මෙම පර්යේෂණය හරහා ක්‍රි.පූ. 3 වැනි සියවසේ සිදු වූ බෞද්ධාගමික ප්‍රබෝධයේ බලපෑම කඳුකරයට බලපෑ ආකාරයත්, මෙම ප්‍රදේශ ජනාවාසකරණයට ලක්වී තිබූ බවත් හඳුනාගත හැකි වේ. ගම්පොල යුගය වන විටද මහායාන ධර්මයේ බලපෑම මත ඇතිවන බෝධිසත්ව වන්දනාව පිළිබඳ සාධක මෙ මඟින් තහවුරු වන අතර ගම්පොල යුගයට අයත් විශිෂ්ට වාස්තුවිද්‍යා හා කලා ලක්ෂණ රාශියක් හඳුනාගත හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


Rohanadeera, M. (2008)***Inscription of Ceylon. Vollume.*** Department Of Archeology.

Paranavithana, S. (1983)***Inscription of Ceylon. Vollume.*** Department of Archeology.

මල්සිරි, ඉෂංක. (2013)***ඉසුරුමුණිය හා වෙනත් ලිපි.***කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

මුදියන්සේ, නන්දසේන. (2000)***සිංහල ශිලා ලේඛන සංග්‍රහය.***කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවැල්ල, සිරිමල්. (2004)***සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.*** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පියනන්ද, අටබාගේ. (1997)***ගම්පොල යුගයේ මූර්ති ශිල්පය.***මධ්‍යම සංස්කෘතික අරමුදල.